**තිරප්පනේ ප්‍රාදේශීය සභාව**

**2022.10.12 වන දින පෙ.ව 10.00 ට පැවති මහ සභා රැස්වීම**

***පැමිණ සිටි ගරු මන්ත්‍රීවරුන්:***

1. ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා
2. ඒ.ජී.මරියහාමි මැතිනිය - ගරු සභාපතිතුමා
3. ඒ. අන්වර් සදාක් මැතිතුමා - ගරු උපසභාපතිතුමිය
4. එස්.තිස්ස විජේසිංහ මැතිතුමා - ගරු සභික තුමා
5. පී.මධුර කුමාර පියරත්න මැතිතුමා - ගරු සභික තුමා
6. බී.ආර්.තිලක් සුසන්ත රාජකරුණා මැතිතුමා - ගරු සභික තුමා
7. ආර්. ප්‍රියංගන ප්‍රසාද් කුමාර රත්නායක මැතිතුමා - ගරු සභික තුමා
8. ආර්.පී.නිසංසලා ලක්මාලි අබේරත්න මැතිනිය - ගරු සභික තුමිය
9. එන්.රශ්මි සංකල්පනා මැතිනිය - ගරු සභිකතුමිය
10. කේ. නදීකා සෙව්වන්දි කරුණාරත්න මැතිනිය - ගරු සභික තුමිය
11. ජේ.රෝහණ විජේතිලක මැතිතුමා - ගරු සභික තුමා
12. ටී.එම්.තිළිණ රසාංග තිලකරත්න මැතිතුමා - ගරු සභික තුමා
13. ටිකිරි බංඩාර වනසිංහ මැතිතුමා - ගරු සභික තුමා

***නොපැමිණි ගරු මන්ත්‍රීවරුන් :***

1. එච්.එම්.නාසිම් මැතිතුමා - ගරු සභික තුමා
2. ජී.නිමල් රාජපක්ෂ මැතිතුමා - ගරු සභික තුමා
3. එච්.බී.නලින් හේරත් මැතිතුමා - ගරු සභික තුමා

***සහභාගී වූ නිළධාරීන් ;***

1. ආර්.පී.පී. රේණුකා ලියනගේ මිය - ලේකම්
2. එම්.ආර්.ඩබ්.සී.කේ.රණවීර මිය - විෂය ලිපිකරු

**(අ) පසුගිය රැස්වීම් වාර්තා සම්මත කිරීම.**

**- 2022.09.20 දින පැවති ගරු මහා සභා වාරයේ වාර්තාව සභා සම්මත කිරීම.**

අද දිනට නියමිත ගරු මහා සභාවේ න්‍යාය පත්‍රයේ මුලින්ම තිබෙන්නේ 2022.09.20 දින පැවති ගරු මහ සභා වාර්තාව සභා සම්මත කර ගැනීමයි.ඒ අනුව පසුගිය සභා වාර්තාවට සංශෝධන තිබේනම් ඒවා ඉදිරිපත් කරන ලෙසත්, පසුගිය සභා වාර්තාව සභා සම්මත කර ගන්නා ලෙසත් මම ගරු මහ සභාවෙන් ඉල්ලා සිටිනවා.

**යෝජනා අංක 133 – 09 -2022.**

**ගරු ප්‍රාදේශීය සභා සභික - එස්.තිස්ස විජේසිංහ මැතිතුමා.**

ගරු සභාපතිතුමනි,ගරු මහ සභාවෙන් අවසරයි. 2022.09.20 දින පැවති ගරු මහා සභා වාර්තාව සත්‍ය හා නිවැරදි බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා සභික -ඒ. අන්වර් සදාක් මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

මේ සඳහා විරෝධතා තිබෙනවා නම් ඉදිරිපත් කරන ලෙස මම ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.

- *ඉන් පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් 2022 සැප්තැම්බර් මස 20 වන දින පැවති ගරු මහාසභා වාර්තාව පැමිණ සිටි සභිකවරුන්ගේ එකඟතාවයෙන් සභා සම්මත විය.*

**(ආ) ගරු සභාපතිතුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන.**

විශේෂ නිවේදන යටතේ කියන්න තියෙන්නේ මෙම වසරේ පවතින ආර්ථික අර්බුදය නිසා බදු නොගෙවූ අය විශාල ප්‍රමාණයක් ඉන්නවා.ඒ අතරින් මස්කඩ වල තියෙන හිඟ මුදල් සියල්ල ගෙව්වා.ඒ වගේම නිවාස කමිටුව මැදිහත් වෙලා කඩ කාමර හිඟ මුදල් අය කර ගත්තා. මම ඔබ සියළු දෙනාගෙන් ඉල්ලීමක් කරනවා ඔබතුමන්ලා සියළු දෙනා මැදිහත් වෙලා තමන්ගේ කොට්ඨාශයේ හිඟ බදු මුදල් අයකරලා දෙන්න කටයුතු කරන්න කියලා.බදු මුදල් ගෙවීම පැහැර හැරපු අය සිටිනවා නම් ඉදිරියේදී ඒ අය සමථ මණ්ඩලයට යොමු කරලා අය කරගන්න කටයුතු කරනවා.මම හිතනවා ඉදිරි වසරේත් මේ තත්ත්වය තියේවි.ඒ වගේම සියළු අපහසුතා මධ්‍යයේ ප්‍රාදේශීය සභාව පවත්වාගෙන යාමට සහාය වීම සම්බන්ධයෙන් මම ඔබ සියළු දෙනාටම බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා.

**(ඇ) ප්‍රාදේශිය සභාව අමතා එවන ලද සංදේශ , පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන මහා සභාවට ඉදිරිපත් කිරීම.**

- ඒ අනුව ආදායම් පරීක්ෂක මහත්මා විසින් 2022 සැප්තැම්බර් මස ආදායම් වාර්තාව ඉදිරිපත් කර සිටිනවා.ඒ අනුව සැප්තැම්බර් මස ආදායම ලෙස රු.209,750.00 ක මුදලක් ආදායම් පරීක්ෂක මහතා විසින් එකතු කර තිබෙනවා.එයද මම දැන ගැනීම සඳහා ගරු මහ සභාවට ඉදිරිපත් කරනවා.

**(ඈ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න.**

කිසිවක් නැත.

**(ඉ) යථා පරිදි කල් දී ඇති යෝජනා.**

**ලිපි අංක - I .**

**ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

ආර්ථික සංවර්ධන කමිටුව පිහිටුවීම සඳහා නව සාමාජිකයන් පත් කිරිම සඳහා ඉදිරිපත් කර ඇති ලිපිය ගරු මහා සභාවේ සුදුසු තීරණයක් ගැනීම සඳහා ඉදිරිපත් කරනවා.ඒ වගේම සහභාගිත්වය පුළුවන් අය පමණක් පත්කර ගැනිමට කටයුතු කරන ලෙස මම ඉල්ලා සිටිනවා.සභාවේ ආදායම් උත්පාදනය කරන යෝජනා මේ කමිටුවට යොමු කරන්න ඕන.

**යෝජනා අංක 134 – 09 -2022.**

**ගරු ප්‍රාදේශීය සභා සභික - බී.ආර්.තිලක් සුසන්ත රාජකරුණා මැතිතුමා.**

අර්ථික සංවර්ධන කමිටුවේ සංයුතිය පහත පරිදි සුදුසු බවට මම යෝජනා කරනවා.

| | | | |
|---|---|---|---|
| සභාපති | | - | පී.මධුර කුමාර පියරත්න මැතිතුමා |
| සාමාජික | 01 | - | එස්.තිස්ස විජේසිංහ මැතිතුමා |
| සාමාජික | 02 | - | ටී.එම්.තිළිණ රසාංග තිලකරත්න මැතිතුමා |
| සාමාජික 03 | | - | ඒ.ජී.මරියහාමි මැතිනිය |
| සාමාජික 04 | | - | කේ. නදීකා සෙව්වන්දි කරුණාරත්න මැතිනිය |

**ගරු ප්‍රාදේශීය සභා සභික -ජේ.රෝහණ විජේතිලක මැතිතුමා.**

තුලාන් වල ආර්ථික සංවර්ධන නිලධාරින් කොපමණ ඉන්නවාද?ඒත් මේ වෙකම් රටේ ආර්ථිකය සංවර්ධනයක් වුනාද?ආර්ථිකය මේ තත්ත්වයේ තියෙද්දී මෙහෙම කමිටුවක් අවශ්‍යද?

**ගරු ප්‍රාදේශීය සභා සභික -ඒ. අන්වර් සදාක් මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරමි.

**ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

මේ සඳහා විරෝධතා තිබෙනවා නම් ඉදිරිපත් කරන ලෙස මම ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.

- *ඉන් පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පැමිණ සිටි සභිකවරුන්ගේ ඒකඟතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

**ලිපි අංක - II .**

**ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

තිරප්පනේ ප්‍රාදේශීය සභාවට අයත් තුරු සෙවණ ව්‍යාපෘතිය සහ භූ දර්ශණ ව්‍යාපෘතිය 2023 වර්ෂයට බදු දීම සඳහා ප්‍රාදේශීය ප්‍රසම්පාදනය යොදා ගැනීම සඳහා අනුමැතිය ඉල්ලමින් ඉදිරිපත් කර ඇති ලිපිය ගරු මහා සභාවේ සුදුසු තීරණයක් ගැනීම සඳහා ඉදිරිපත් කරනවා.

**යෝජනා අංක 135 – 09 -2022.**

**ගරු ප්‍රාදේශීය සභා සභික -එස්.තිස්ස විජේසිංහ මැතිතුමා.**

තුරු සෙවණ ව්‍යාපෘතිය සහ භූ දර්ශණ ව්‍යාපෘතිය 2023 වර්ෂය සඳහා බදු දීම සඳහා ප්‍රාදේශීය ප්‍රසම්පාදනය සුදුසු බවට මම යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා සභික -ඒ. අන්වර් සදාක් මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරමි.

**ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

මේ සඳහා විරෝධතා තිබෙනවා නම් ඉදිරිපත් කරන ලෙස මම ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.

- *ඉන් පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පැමිණ සිටි සභිකවරුන්ගේ ඒකඟතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

**ලිපි අංක - III .**

**ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

2023 වර්ෂය සඳහා මස්කඩ හා ගෝතකාසාර ටෙන්ඩර් කිරීම සඳහා ප්‍රාදේශීය ප්‍රසම්පාදනය මඟින් සිදු කර ගැනීම සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති ලිපිය ගරු මහා සභාවේ සුදුසු තීරණයක් ගැනීම සඳහා ඉදිරිපත් කරමි.ඒ වගේම මස්කඩවල අවම ලංසුව සංශෝධනය කරනවාද යන්න පිළිබඳ සුදුසු තීරණයක් ගන්නා ලෙස මම ඉල්ලා සිටිනවා.

**යෝජනා අංක 136 – 09 -2022.**

**ගරු ප්‍රාදේශීය සභා සභික -ඒ. අන්වර් සදාක් මැතිතුමා.**

සියළු දෙනාගෙන්ම අවසරයි.මස්කඩ වලට මේ වසරේදි මුඛ හා කුර රෝගය තිබුණු කාලවලදිත් බදු මුදල් අය කිරිම සිදු කළ නිසා මස් කඩ වලට සභාවෙන් අසාධාරණයක් සිදු වුණා.ඒ වගේම මෙම ලිපියෙන් ඉල්ලා තිබුණු විදිහට 2023 වර්ෂය

සඳහා මස්කඩ හා ගෝතකාසාර ටෙන්ඩර් කිරීම සඳහා ප්‍රාදේශීය ප්‍රසම්පාදනය මඟින් සිදු කර ගැනීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - බී.ආර්.තිලක් සුසන්ත රාජකරුණා මැතිතුමා</u>.**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

මේ සඳහා විරෝධතා තිබෙනවා නම් ඉදිරිපත් කරන ලෙස මම ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.

- *ඉන් පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පැමිණ සිටි සභිකවරුන්ගේ එකඟතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

**<u>ලිපි අංක - IV .</u>**

**<u>ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

අඩු ආදායම් ලබන පළාත් පාලන ආයතනවල ආදායම් තත්ත්වය ඉහල නැංවීම සඳහා යෝජනා කැඳවීම යටතේ නව යෝජනා ඉදිරිපත් කිරීම සම්බන්ධ ලිපිය ගරු මහා සභාවේ සුදුසු තීරණයක් ගැනීම සඳහා ඉදිරිපත් කරනවා.මෙම ලිපිය මීට පෙරත් සභාවට ඉදිරිපත් කළා.ලංකාවට ඩොලර් ලැබෙන යෝජනා සඳහා ප්‍රමුඛතාවයක් ලබා දෙන්න කියලා අපිට දන්වලා තියෙනවා.ඒ නිසා අපි කොහු ආශ්‍රිත නිෂ්පාදන වැඩ පලක් කරමු කියන යෝජනාව දන්වලා යැව්වා නමුත් මේ සඳහා සඳහා සභා තීරණයක් අවශ්‍යයි.

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - පී.මධුර කුමාර පියරත්න මැතිතුමා.</u>**

සියළු දෙනාගෙන්ම අවසරයි. කොහු ආශ්‍රිත නිෂ්පාදන වැඩ පලක් කරමු කියන යෝජනාව සුදුසු බවට මම යෝජනා කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික -ඒ. අන්වර් සදාක් මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

මේ සඳහා විරෝධතා තිබෙනවා නම් ඉදිරිපත් කරන ලෙස මම ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.

- *ඉන් පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පැමිණ සිටි සභිකවරුන්ගේ එකඟතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

**<u>ලිපි අංක - V .</u>**

**<u>ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

2023 වර්ෂය සඳහා බදු පැනවීම සම්බන්ධ කෙටුම්පත ගරු මහා සභාවේ සුදුසු තීරණයක් ගැනීම සඳහා ඉදිරිපත් කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික -එස්.තිස්ස විජේසිංහ මැතිතුමා.</u>**

2023 වර්ෂය සඳහා තව මාස 03 ක් තියෙනවා.බදු මිනිස්සුන්ට දරන්න බැ.සභාවේ වියදම් වැඩි නිසා බදු මිනිස්සුන්ට දරන්න බැ.සභාවේ වියදම් වැඩි නිසා සමහර බදු මුදල් වැඩි කරලා තියෙනවා.අඩු ආදායම්ලාභී සභාවක් වුනත් උලගල්ල හෝටලයෙන් 2019,2020,2021,2022 වර්ෂ සඳහා විශාල මුදලක් අයකර ගන්න තියෙනවා.මේ වෙනකොට උලගල්ල හෝටලයෙන් අපිට යම් මුදලක් එවලා තියෙනවා.නමුත් මේ වෙලාවේ උලගල්ල හෝටලයත් එක්ක නඩු කියනවා.සමස්තයක් විදිහට ලංකාවේ තියෙන සමහර හෝටල් එක්ක උලගල්ල හෝටලය විශාල මුදලක් උපයනවා. නමුත් මෙවැනි ව්‍යාපාර සඳහා කොරෝනා වසංගතයත් බලපෑම් කළා.නමුත් උලගල්ල හෝටලයෙන් 2019 වර්ෂයට පමණක් බලපත්‍ර ගාස්තු ගෙවලා තියෙනවා.ඉතිරි අවුරුදු 03 සඳහා හිඟ බදු මුදල් ඉතා කඩිනමින් අය කර ගැනීම සඳහා කටයුතු කරන්න.ඒ වගේම 2023 වර්ෂය සඳහා සංචාරක හෝටල් වලින් අය කරන බලපත්‍ර ගාස්තුව ලෙස වාර්ෂික

ආදායමෙන් 1% සිට 0.5% දක්වා අඩු කර අයකර ගැනිම සුදුසු බවට යෝජනා කරනවා.නමුත් පෙර වසරවල් සඳහා 1% විය යුතුයි.

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික -ජේ.රෝහණ විජේතිලක මැතිතුමා.</u>**

රෝහණ මන්ත්‍රීතුමා ගෙන ආ යෝජනාව ස්ථිර කරන අතරම උලගල්ල හෝටලයත් එක්ක නඩුවක් දාලා තියෙන අවස්ථාවක සල්ලි අරගෙන තියෙනවා.මහා පරිමාණ ව්‍යාපාර වලට බදු සහන දිලා මේ සියල්ල සාමාන්‍ය මිනිස්සු පිට පටවනවා.මේක අසාධාරණයි.

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - පී.මධුර කුමාර පියරත්න මැතිතුමා.</u>**

රෝහණ මන්ත්‍රීතුමා කියපු සියළු දේ හරි.සිංගප්පූරුව දියුණු වුනේ බදු ප්‍රතිපත්තිය සහ විගණනය නිසා.අපේ රටේ මෝඩ පාලකයෝ අද රට මේ තත්ත්වයට පත් කළා. සංචාරක හෝටල් වලින් අය කරන බලපත්‍ර ගාස්තුව ලෙස වාර්ෂික ආදායමෙන් 0.5% දක්වා අඩු කිරීම සම්බන්ධයෙන් ගෙන ආ යෝජනාව සම්බන්ධයෙන් මම පෞද්ගලිකව විරෝධතාවය ප්‍රකාශ කරනවා.උද්ධමත් සමඟ එයාලා ගාස්තු වැඩි කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික -ජේ.රෝහණ විජේතිලක මැතිතුමා.</u>**

බදු මුදල් අඩු කරන්න කියලා සංචාරක හෝටල් වලින් ඉල්ලීමක් කරලා නැති පසුබිමක තමා අපි මේ යෝජනාව ගෙනල්ලා තියෙන්නේ.ඒ වගේම පසුගිය වසරේ හිඟ මුදල් ලබා දෙනවා නම් 2023 වර්ෂය සඳහා පමණක් මේ බදු මුදල් සංශෝධනය අදාළ කරගන්නා ලෙස මම ඉල්ලා සිටිනවා. ඒ වගේම වාර්ෂික ආදායමින් 1% ක ප්‍රමාණය ලක්ෂ 33 ක් නම් එයාලගේ ආදායම විශාල ප්‍රමාණයක් වෙනවා.

**<u>ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

බලපත්‍ර ගාස්තු ලෙස 1% අය කළාම සංචාරක හෝටල් වලට අමාරුයි.සමහර සභාවලින් හෝටල් බලපත්‍ර ගාස්තුව විදිහට ලක්ෂ 2 ක් 02 ½ ක් විතර ප්‍රමාණයක් තමා අය කරන්නේ.නිශ්චිත ප්‍රතිශතයක් නෑ වාර්ෂික ආදායමෙන් 0.1% - 1% දක්වා ප්‍රමාණයක් අපිට අය කර ගැනීම කරන්න පුළුවන්.

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික -එස්.තිස්ස විජේසිංහ මැතිතුමා.</u>**

අපට වෙන සභාවලින් වැඩක් නෑ.අපේ සභාවේ ආදායම අඩු නිසා තමයි ගැටළුව.අපි මේ බදු ප්‍රතිශතය 2024 වසරේ වෙනස් කරමු.

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික -ඒ. අන්වර් සදාක් මැතිතුමා.</u>**

කසල බදු සඳහා සහනයක් ලබා දෙන ලෙස මම ගරු මහ සභාවෙන් ඉල්ලා සිටිනවා.

**<u>ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

කසල බදු මුදල ඉන්ධන වියදම් වැඩි වුන නිසා පොඩි ගානයි වැඩි කළේ.

- *ඉන් පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව පී.මධුර කුමාර පියරත්න මැතිතුමා විරෝධතාවය ප්‍රකාශ කල අතර එම විරෝධතාවයට යටත්ව පැමිණ සිටි සභිකවරුන්ගේ එකඟතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

**<u>ලිපි අංක - VI .</u>**

**<u>ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

අතිකාල දීමනා අනුමත කර ගැනිම සඳහා ඉදිරිපත් කර ඇති ලිපිය ගරු මහා සභාවේ සුදුසු තීරණයක් ගැනීම සඳහා ඉදිරිපත් කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - බී.ආර්.තිලක් සුසන්ත රාජකරුණා මැතිතුමා</u>.**

අතිකාල දීමනා ලබා දීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික -ඒ. අන්වර් සදාක් මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

- *ඉන් පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පැමිණ සිටි සභිකවරුන්ගේ එකඟතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

**<u>ලිපි අංක - VII .</u>**

**<u>ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

539 වෙල්ලමුදාව ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ ශ්‍රී සුමනසාර දහම් පාසල් ගොඩනැගිල්ල ඉදිකිරිමට යෝජිත ඉඩම සඳහා දීර්ඝ කාලීන බදු බලපත්‍ර ලබා දීම සඳහා නිර්දේශය ඉල්ලමින් තිරප්පනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් එවා ඇති ලිපිය ගරු මහා සභාවේ සුදුසු තීරණයක් ගැනීම සඳහා ඉදිරිපත් කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - පී.මධුර කුමාර පියරත්න මැතිතුමා.</u>**

මම මෙම ස්ථානය පෞද්ගලිකව නිරීක්ෂණය කළා.මේ සඳහා පුද්ගලික විරෝධතාවයක් තිබුණා.මෙම ඉඩම 539 වෙල්ලමුදාව ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ ශ්‍රී සුමනසාර දහම් පාසල් ගොඩනැගිල්ල ඉදිකිරිමට දීර්ඝ කාලීන බදු බලපත්‍ර ලබා දීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික -ඒ. අන්වර් සදාක් මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

- *ඉන් පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පැමිණ සිටි සභිකවරුන්ගේ එකඟතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

**<u>ලිපි අංක - VIII .</u>**

**<u>ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

පළාත් සහා රාජ්‍ය වියදම් කළමණාකරණය- 2022 සම්බන්ධයෙන් පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් එවා ඇති ලිපිය ගරු මහා සභාවේ සුදුසු තීරණයක් ගැනීම සඳහා ඉදිරිපත් කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික -එස්.තිස්ස විජේසිංහ මැතිතුමා.</u>**

අපේ සභාවේ වියදම් අඩු කර ගන්න සේවකයන්ගේ පැමිණීම සීමා කළා.රෝහණ මන්ත්‍රීතුමා ප්‍රකාශ කල විදිහට ලංකාව කඩා වැටිලා අපි බංකොළොත් රාජ්‍යයක් වෙලා.මේ සඳහා රාජ්‍ය නිලධාරීන් සහ දේශපාලන අධිකාරිය සම සමව වගකිව යුතුයි.මේ සඳහා සේවකයෝ වගකිව යුතු නෑ.මේ නිසා සියළුම අනියම් සේවකයන් අවශ්‍යතාවය අනුව ඉදිරි නොවැම්බර් මස 01 වන දින සිට සතියට දින 05 ම කැඳවීමට කටයුතු කරන්න.අපේ සභාවේ රැකියා ලක්ෂයේ අය සහ අනියම් සේවකයෝ යොදලා වැඩ කරන්න ක්‍රම වේදයක් සකසන්න.ක්‍රමවේදය ඊළග සභාවට ඉදිරිපත් කරන්න.ඒ වගේම රැකියා ලක්ෂයේ අය රටට බරයි කියලා අයින් කරනවා කියලා තියෙනවා.මේ බර හැදුවේ කවුද?මේ අය සියල්ලන්ම ආදායම් උත්පාදන මාර්ග වලට යොමු කරන්න.අනියම් සේවකයෝතමන්ගේ විෂය පථයට පිටින් වැඩ කරන්නේ නෑ.පුද්ගලික ආයතනයට දුන්නා නම් කොච්චර කොම්පෝස්ට් හදනවාද?

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - පී.මධුර කුමාර පියරත්න මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමනි, අනියම් සේවකයන් සියළු දෙනා වැඩය ගෙන්වීම සම්බන්ධයෙන් ගෙන ආ යෝජනාව මම ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

මේ පිළිබඳව මමත් අදහසක් ඉදිරිපත් කරන්න කැමතියි.ගිය වර ජනාධිපතිතුමා රජයේ ව්‍යාපාති ක්‍රියාත්මක කරන්න මේ අය යොදා ගන්න තමයි වැඩ පිළිවෙල සකස් කළේ.අපි තමා මේකට වගකියන්න ඕන.

**ගරු ප්‍රාදේශීය සභා සභික - ටී.එම්.තිළිණ රසාංග තිලකරත්න මැතිතුමා.**

රැකියා ලක්ෂයේ අය මේ වන විට 08 දෙනෙක් ඉන්නවා.මේ අයට දවසකට රු.750.00 ක මුදලක් තමා වැටෙන්නේ.මේ අය මෙම මුදලින් රැකියාවට එන එකම වටිනවා.රජයේ රැකියාවත් නිසා මේ අය රැකියාවේ එල්ලිලා ඉන්නවා.මේ අය හොඳ ඵලදායි ව්‍යාපාතියකට දාලා ඒ එන ආදායමින් කොටසක් ගෙවන විදිහේ ක්‍රමවේදයක් සකසන්න.

**ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

අපි පැල තවානක් දාමු.ආර්ථික කමිටුවට මේ අදහස දාලා ක්‍රියාත්මක කරමු.මන්ත්‍රීවරු විදිහට ඔබ සියළු දෙනාත් මේ සඳහා උදව් කරන්න.

**ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

සභාවට ආශිර්වාදයක් මේ අය එච්ච එක.නමුත් මේ අය මේ වන තුරු ඵලදායී වැඩකට යෙදෙව්වේ නෑ.විභාග පාස්වුණු අයට විතරයි මේ රටේ රැකියා නිර්මාණය වෙලා තියෙන්නේ.මේ අයට වෘත්තීය පුහුණුවක් අවශ්‍ය නම් පුහුණුවක් ලබා දෙන්න ක්‍රමවේදයක් සකස් කරන්න.මේ අය දිවා කාලයේ වැඩක් නැතිවයි ඉන්නේ.ඉදිරි මාස 03 මේ අය ඵලදායී දෙයකට යොමු කරන්න.පැල තවානත් කරනවා නම් ප්‍රදේශයට උචිත භෝග වර්ග හිටවන්න.එළවළු වර්ග නම් වඩාත් උචිතයි.

**ගරු ප්‍රාදේශීය සභා සභික - බී.ආර්.තිලක් සුසන්ත රාජකරුණා මැතිතුමා.**

මේ අය දාලා මාර්ග පොදු ක්‍රීඩා පිටි එළි පෙහෙලි කරන්න යොදා ගත්තා නම් සුදුසුයි.

**ගරු ප්‍රාදේශීය සභා සභික - ටිකිරි බංඩාර වනසිංහ මැතිතුමා**

මම හිටපු ජනාධිපතිතුමාට පුද්ගලිකව ගරු කරනවා සා.පෙළ.අසමත් අයට රැකියා ලබා දෙන ක්‍රමවේදයක් සකසපු එකට.මේ අය කොන්ත්‍රාක්තරුවන් බැහැර කරලා වැඩ කරගන්න තමයි මේ ක්‍රමවේදය සකස් කළේ.

**ලිපි අංක - IX .**

**ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

බදු නිදහස් ප්‍රතිපත්තියක් සැකසීම සඳහා සුදුසු යෝග්‍යතා සහ නිර්ණායක සම්බන්ධයෙන් ගරු මහ සභාවේ නිර්දේශ ඉල්ලමින් ඉදිරිපත් කර ඇති ලිපිය ගරු මහා සභාවේ සුදුසු තීරණයක් ගැනීම සඳහා ඉදිරිපත් කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා සභික -එස්.තිස්ස විජේසිංහ මැතිතුමා.**

මේ තින්දුව ගත්තොත් සභාවට අසාධාරණයක් වෙයි.මේ අදහස හොඳයි.පවතින කාලය තුළ අවස්ථාව අනුව බදු නිදහස් දීම පිළිබඳව තීරණයක් ගැනීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා සභික -ඒ. අන්වර් සදාක් මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

- *ඉන් පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පැමිණ සිටි සභිකවරුන්ගේ එකඟතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

**ලිපි අංක - X .**

WPPF- 5497 අංක දරන කැබ් රථය සඳහා නව ටයර් කට්ටලයක් සහ එලායින්මන්ට් කිරිමට ඉල්ලා ඇති ලිපිය ගරු මහ සභාවේ සුදුසු තිරණයක් ගැනීම සඳහා ඉදිරිපත් කරමි.

**ගරු ප්‍රාදේශීය සභා සභික - පී.මධුර කුමාර පියරත්න මැතිතුමා.**

WPPF- 5497 අංක දරන කැබ් රථය සඳහා නව ටයර් කට්ටලයක් සහ එලායින්මන්ට් කිරිම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා සභික -ඒ. අන්වර් සදාක් මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

- *ඉන් පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පැමිණ සිටි සභිකවරුන්ගේ එකඟතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

**<u>(ඊ) කාරක සභාවල වාර්තා ඉදිරිපත් කිරීම</u>.**

**<u>ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම යටතේ පහත සඳහන් කමිටු වාර්තා ගරු මහ සභාවට ඉදිරිපත් කර සිටිනවා.

I. 2022.09.20 වන දින පැවති ළමා හා කාන්තා කමිටු වාර්තාව.

II. 2022.09.21 වන දින පැවති කාර්මික කමිටු වාර්තාව.

**<u>(උ) ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ ඉදිරිපත් කිරීම.</u>**

**<u>ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

2022 සැප්තැම්බර් මස ආදායම් වියදම් අයකර ගැනීම පිළිබඳ මාසික ප්‍රගති වාර්තාව (එල්.ජී.06) හා මාසික වියදම් වාර්තාව (එල්.ජී.13) ගරු මහා සභාවේ දැන ගැනීම සඳහා මෙන්ම අනුමැතිය සඳහා ද ඉදිරිපත් කරනවා.

**<u>යෝජනා අංක 137 – 09 -2022.</u>**

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - ඒ.අන්වර් සදාක් මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමනි, සියළුම දෙනාගෙන් අවසරයි. සභාවට ඉදිරිපත් කරන ලද 2022 සැප්තැම්බර් මස ආදායම් වියදම් අයකර ගැනීම පිළිබඳ මාසික ප්‍රගති වාර්තාව (එල්.ජී.06) හා මාසික වියදම් වාර්තාව ( එල්.ජී.13) සත්‍ය වාර්තා බවට මම යෝජනා කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - බී.ආර්.තිලක් සුසන්ත රාජකරුණා මැතිතුමා.</u>**

එම යෝජනාව මම ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

මේ සඳහා විරෝධතා තිබෙනවා නම් ඉදිරිපත් කරන ලෙස මම ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.

- *ඉන් පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පැමිණ සිටි සභිකවරුන්ගේ එකඟතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

**<u>(ඌ) නොපැමිණෙන මන්ත්‍රීවරුන්ගේ නිවාඩු අවසර ලිපි ඉදිරිපත් කිරීම.</u>**

කිසිවක් නැත.

**<u>(එ) ගරු සභිකවරුන්ගේ වෙනත් අදහස් ඉදිරිපත් කිරීම.</u>**

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - ඒ.අන්වර් සදාක් මැතිතුමා.</u>**

සියළු දෙනාගෙන් අවසරයි.රැකියා ලක්ෂයේ අය ස්ථිර කරන්න කියලා අපි ජනාධිපතිතුමාගෙන් විශේෂ ඉල්ලීමක් කරමු.ඒ වගේම නාච්චාදුව ප්‍රදේශයේ වීදි ලාම්පු ප්‍රශ්ණය විසඳන්න කියලා මම ගරු සභාපතිතුමාගෙන් විශේෂ ඉල්ලීමක් කරනවා.ඒ වගේම මස්කඩ හිමියන්ට ෂෝට් හවුස් එකක් නෑ.සභාවෙන් පුංචිව මුදලක් හරි වැය කරලා එකක් හදලා දෙන්න කියලා මම ඉල්ලා සිටිනවා.ස්තූතියි.

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - ආර්. ප්‍රියංගන ප්‍රසාද් කුමාර රත්නායක මැතිතුමා.</u>**

මට කියන්න තියෙනවා මගේ කොට්ඨාශය වන 539 වෙල්ලමුදාව තුලානේ පවතින වල් අලි ප්‍රශ්ණය සම්බන්ධයෙන්.අලි වැටක් තියෙනවා.ඒ වගේම අලි වැටේ කාර්ය මණ්ඩලය 30 දෙනෙක් විතර වැඩ කරනවා.අලි ටික ගම ඇතුළට දාලා අලි

වැට හදනවා.අලින්ට එළියට යන්න බෑ.වෙල්ලමුදාව ගමේ විහාරස්ථානය හදන්න යෝජිත ඉඩම සුද්ධ කලා.ඒ වගේම අල්ලපු ඉඩමේ මිනිස්සු වල් අලි ප්‍රශ්ණය නිසා ගේ අතැරලා ගියා.ඒ නිසා එතැනට වීදි ලාම්පුවක් සකසලා දෙන්න.

ඒවගේම වෙල්ලමුදාව තම්මැන්නාගල පාර කැඩිලා නිසා කුඩාගම කාපට් පාරේ වාහන යනවා.සභාවෙන් බොරළු ප්‍රවාහනය කරන්න මුදලක් අය කරන නිසා ඒ මුදල් යොදලා ඒ පාර හදලා දෙන්න.

<u>ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>

අපි කාපට් පාරේ යන වාහන නවත්වමු.

<u>ගරු ප්‍රාදේශීය සභා සභික - ටී.එම්.තිළිණ රසාංග තිලකරත්න මැතිතුමා</u>

වල් අලි ප්‍රශ්ණෙ මගේ කොට්ඨාශයේ තුලාත් 05 ටම තියෙනවා.මේ ප්‍රශ්ණෙ සිවිල් ආරක්ෂක අංශයේ අය ගම් වලට දාන්න.වන ජීවි කාර්යාලය නගරවල් වල හදලා වැඩක් නෑ.ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරින් එක්ක සම්බන්ධ වෙලා මේ ප්‍රශ්ණෙ විසඳා දෙන ලෙස මම ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා සභික -එස්.තිස්ස විජේසිංහ මැතිතුමා.</u>

මස්කඩ ටෙන්ඩර් ලබන වසරේ සිට වැඩි කරමු කියන එකඟතාවය මත මේ වසරේ තැන්පත් මුදල් වැඩි කළේ නෑ.ඒ නිසා එයාලගේ මුදලින් ෂෝට් හවුස් හදාගන්න කියන්න.

අපේ රටේ අධ්‍යාපන ක්‍රමය ගත්තොත් සම්පූර්ණයෙන්ම වැරදියි.රැකියාවක් ගන්න තමා උගන්වන්නේ.

<u>ගරු ප්‍රාදේශීය සභා සභික - පී.මධුර කුමාර පියරත්න මැතිතුමා.</u>

වන ජීවි නිලධාරින්ට අලි අල්ලන්න බෑ.දිස්ත්‍රික් ලේකම්ගේ නියෝගය අරන් දෙන්න.ළමා හා කාන්තා කමිටුව හරහා මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් පාසල් වලට ගිහින් ඉහළ නිලධාරින් දැනුවත් කරන්න.මම මේ අවස්ථාවේදි මරදන්කඩවල ස්ථානාධිපතිවරයාට ස්තූතිවන්ත වෙනවා.ඒ වගේම තිරප්පනේ පොලිසිය භාර සහකාර පොලිස් අධිකාරිවරයාට මගේ අප්‍රසාදය පළ කරනවා.මත් ද්‍රව්‍ය දිනෙන් දින තරුණ පරම්පරාව ගිල ගනිමින් පවතිනවා. තරුණ පරම්පරාව විවේක කාලය ගත කරන්නේ හරිම අමුතු විදිහකට.විවේක කාලය අර්ථවත්ව වැඩ කරන්න ක්‍රමවේදයක් සකසන්න. ගුරුවරු, විදුහල්පතිවරු අරක්කු පෙරනවා කියලා ප්‍රකාශ කළා.එහෙම කරන අය ඉන්නවානම් විනයානුකූලව කටයුතු කරන්න.දැන් මේ දවස්වල මාස්කන්නේ බඩ ඉරිඟු වගා කරන්න ලැහැස්ති වෙලා ඉන්නවා.ඒ නිසා ක්ෂුද්‍ර මුල්‍ය ආයතන ගම් ආක්‍රමණය කරමින් පවතිනවා.ඒකට විසඳුමක් ලබා දෙන ලෙස මම මේ සභාවෙන් ඉල්ලීමක් කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා සභික - කේ. නදීකා සෙව්වන්දි කරුණාරත්න මැතිනිය.</u>

සියළු දෙනාගෙන් අවසරයි.මම මධුර මන්ත්‍රීතුමාට ළමා හා කාන්තා කමිටුව කරගෙන යාම සඳහා සහයෝගය ලබා දීම පිළිබඳව ස්තූතිවන්ත වෙනවා.පාසල් වලට ඇස් පරීක්ෂාවට සහ දන්ත සායනයක් පවත්වන්න ජංගම සේවාවක් වගේම මාසයකට වතාවක් ධම්ම වැඩසටහනකුත් මත්ද්‍රව්‍ය පිළිබඳව මාසෙකට දින 01 ක් වෙන් කරන්න් මම සැලසුම් කරගෙන ඉන්නවා.ඒ සියළු දේවල් සඳහා ඔබ සියළු දෙනාගෙන් සහ ගරු සභාපතිතුමාගෙන් ඉල්ලිමක් කරනවා කලාප කාර්යාලයට දැනුම් දීලා අවශ්‍ය සහයෝගය ලබා දෙන්න කියලා.

<u>ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>

වැඩසටහනක් සකස් කරන්න.මම මගේ පැත්තෙන් කරන්න ඕන සියළු දේවල් සිදු කරලා දෙන්නම්. පැමිණි සියළු දෙනාටම බෙහෙවින් ස්තූතිවන්ත වෙනවා. 2022.10.12 වන දින පැවති ගරු මහ සභාවේ වැඩ කටයුතු ප.ව.12.20 ට පමණ අවසන් විය.